සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2020**

# 41 - බුද්ධ ධර්මය

## නව නිර්දේශය

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2020 (නව නිර්දේශය)

## 41 - බුද්ධ ධර්මය

### ප්‍රශ්නපත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදීයාම

**I - පත්‍රය** - කාලය : පැය 02 යි

වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්ණ 50 කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.

**II - පත්‍රය** - කාලය : පැය 03 යි

මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් දෙකකින් යුක්තය.

I කොටස - ව්‍යුහගත ප්‍රශ්න 03 කින් ප්‍රශ්න 02 කට පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40 කි.

II කොටස - රචනා වර්ගයේ ප්‍රශ්න 05 කි. ප්‍රශ්න 03 කට පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 60 කි.

අවසාන ලකුණ ගණනය කිරීම : I පත්‍රය = 100
II පත්‍රය = 100

අවසාන ලකුණ : **200 ÷ 2 = 100**

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ............................................................ √ △ 4/5
............................................................
............................................................

(ii) ............................................................ √ △ 3/5
............................................................
............................................................

(iii) ............................................................ √ △ 3/5
............................................................
............................................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

මෙවර සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

බුද්ධ ධර්මය I
பௌத்தம் I
Buddhism I

41 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ※ උත්තර පත්‍රයේ, පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**
- ※ එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** යි.

**1.** බුදුරජාණන් වහන්සේ මහාකරුණා සමාපත්ති ඤාණයෙන් බලා, කායික මානසික දුක් දොම්නස් විඳිමින් සිටියවුන් දැක ඔවුන්ට පිහිට වූ බව බෞද්ධ මූලාශ්‍රය තුළින් හෙළිවෙයි. එම ඤාණය,

(1) රහතන් වහන්සේලාට ද ඇත.
(2) බෝධිසත්වයන් තුළ ද ඇත.
(3) වෙනත් ශ්‍රාවකයන්ට ද උපදවා ගත හැකි ය.
(4) බුදුවරුන්ට ම සුවිශේෂී වූවකි.
(5) දරුවන් පිළිබඳව දෙමාපියන් තුළ ද තිබේ.

**2.** මහාසීහනාද සූත්‍රයට අනුව බුදුරදුන් තුළ ඇති දසවිධ ඤාණබල අතුරින් එකක් වන දුසිරිත් ඇති සත්ත්වයන් මරණින් මතු දුගතිගාමී වීමත්, සුසිරිත් ඇති සත්ත්වයන් මරණින් මතු සුගතිගාමී වීමත්, දැන දැකගැනීමේ නුවණ හඳුන්වන්නේ,

(1) පුබ්බේනිවාසානුස්සති ඤාණය ලෙස ය.
(2) නානාධිමුක්තික ඤාණය ලෙස ය.
(3) චුතුපපාත ඤාණය ලෙස ය.
(4) කම්මවිපාක ඤාණය ලෙස ය.
(5) සබ්බත්ථගාමිණිපටිපදා ඤාණය ලෙස ය.

**3.** බුද්ධත්වයට පත්වීමෙන් පසු දම්සක් දෙසනු පිණිස බරණැස ඉසිපතනයට වැඩම කළ බුදුරදුන් මග දී හමු වූ උපක ආජීවකයා අමතා "තමන් වහන්සේ සම්මාසම්බුද්ධ යැ"යි වදාළ බව සඳහන් වේ. ඉන් අදහස් වන්නේ උන්වහන්සේ,

(1) දස මරසෙන් පැරද වූ බව ය.
(2) පෙරුම්දම් පුරා බුදු වූ බව ය.
(3) සියලු දුකින් මිදුණු බව ය.
(4) තර්කානුකූලව පරම සත්‍යාවබෝධය ලද බව ය.
(5) සිවුසස් දහම මනාකොට දත් බව ය.

**4.** බුදුරජාණන් වහන්සේගේ විශිෂ්ට ගුණ අතුරින් තාදී බුදුගුණය ප්‍රකට කෙරෙන බොහෝ අවස්ථා බුදුසිරිත තුළින් පෙන්වා දිය හැකි ය. එම ගුණයෙන් ප්‍රකට වන්නේ,

(1) සියලු කෙලෙස් දුරු කළ බවයි.
(2) සියලු පූජාවන් ලැබීමට සුදුසු බවයි.
(3) අටලෝ දහමින් කම්පා නොවී කටයුතු කළ බවයි.
(4) උස්මිටිකම් නොසලකා සැමට සමව පිහිටවන බවයි.
(5) තුන් ලොව ම මැනවින් අවබෝධ කළ බවයි.

**5.** සෝණදණ්ඩ බ්‍රාහ්මණ තෙමේ සිය නුවරට වැඩම කළ බුදුරදුන් දැක්මට තමා යායුතු බවත් උන්වහන්සේ තමන් වෙත වැඩමවීම නුසුදුසු බවත් පෙන්වා දෙමින් බුදුන්වහන්සේව ඉහළින් අගය කළේ ය. ඔහු පෙන්වා දුන් කරුණුවලින් එකක් නම්, බුදුරජාණන් වහන්සේ

(1) අති උතුම් ආර්ය සත්‍යය ලොවට හෙළි කළ එක ම ශාස්තෘවරයා වේ යන්නයි.
(2) දුෂ්කර ක්‍රියාකොට බුදු බවට පත් උතුමෙකි යන්නයි.
(3) අසිරිමත් ප්‍රාතිහාර්ය පෑමෙහි සමත් වන්නේය යන්නයි.
(4) වෙත දෙතිස් මහාපුරුෂ ලක්ෂණ ඇත යන්නයි.
(5) සියලු සම්පත් හැරදමා පැවිදි වූ උතුමෙකි යන්නයි.

**6.** සුත්ත, විනය සහ අභිධම්ම යන යෙදුම්වල අර්ථය පුරාණාචාර්යවරුන් විසින් නිර්වචනය කරනු ලැබ ඇත. ඒ අනුව අභිධම්ම යන්නට දක්වා ඇති නිර්වචනය වන්නේ,

(1) අතිරේක හා විශේෂ වශයෙන් ධර්මය විවරණය කිරීම යන්නයි.
(2) ධර්මය පර්යාය වශයෙන් දැක්වීම යන්නයි.
(3) නොයෙක් ක්‍රම ඇති ධර්මය යන්නයි.
(4) කිරි මෙන් ධර්මය දොවා දීම යන්නයි.
(5) ධර්මයෙහි අර්ථය දැක්වීම යන්නයි.

**7.** ත්‍රිවිධ රත්නය සූවිසි ගුණයකින් සමන්විත ය. ඒවායින් සවැදෑරුම් ගුණයකින් යුක්ත වන ධර්මරත්නයේ සවැනි ගුණය ලෙස දක්වා ඇත්තේ,

(1) ධර්මය විශ්වාස මාත්‍රයක් නොවේ යන්නයි.
(2) ධර්මය ප්‍රඥාවන්තයන් සඳහා ය යන්නයි.
(3) ධර්මය තම තමා විසින් ම නුවණින් දැනගත යුතු ය යන්නයි.
(4) ධර්මය අවබෝධ කිරීමට දියුණු විඥානයක් අවශ්‍ය ය යන්නයි.
(5) ධර්මය මෙලොවදී ම ප්‍රතිඵල උදාකරන්නේ ය යන්නයි.

**8.** දේවවාදී නොවන බුදුදහම මිනිස් සංහතිය ඉදිරියේ ඇති සියලු ගැටලු අභිබවා සිටින මහා ගැටලුව වන දුක පිළිබඳ අවදිකමත්, ඉන් අත්මිදීමේ මගත් පෙන්වාදීම අරමුණු කොට ඇත. ඒ අනුව පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ,

(1) දෙවිවරුන්ට ද බුදු බවට පත්විය හැකි ය යන්නයි.
(2) සූත්‍ර පිටකයේ හමුවන්නේ බෞද්ධ දෙවිවරුන් ය යන්නයි.
(3) බුදුදහම දේවසංකල්පවලට සෘජුව ම පහරදෙයි යන්නයි.
(4) බෞද්ධයන් පුදසිරිත් කළ යුත්තේ බෞද්ධ දෙවිවරුන්ට ය යන්නයි.
(5) නිවන් මග යන්නාට දේව විශ්වාස අදාළ නොවේ යන්නයි.

**9.** සෙනසුරාදා දිනවල අප විහාරස්ථානයේ පැවැත්වෙන ධර්ම සාකච්ඡාවට නිතර සහභාගී වූ එක් උපාසිකාවක් පසුගිය දා මිය ගියා ය. එම අවමගුල් උත්සවයේ දී කථාවක් පැවැත් වූ අයෙකු එතුමියට මරණින් මතු හොඳ ආත්මයක් ලැබේවායි ප්‍රාර්ථනා කළ අතර ඒ පිළිබඳ මෙවර ධර්ම සාකච්ඡාවේ දී විවිධ මත පළ විය. ඒ අතුරින් ධර්මානුකූල වූයේ,

(1) විඥානය මිස ආත්මයක් මෙලොවින් පරලොවට නොයන්නේ ය යන්නයි.
(2) ස්ථිර හෝ තාවකාලික ආත්මයක් බුදුදහම නොපිළිගනී යන්නයි.
(3) බුදුදහමට අනුව ආත්මය මරණයෙන් කෙළවර වේ යන්නයි.
(4) ආත්මය සසර සැරිසරන්නේ කර්මානුරූපව ය යන්නයි.
(5) ආත්මයේ පැවැත්ම නිවනින් අවසන් වේ යන්නයි.

**10.** පාරම්පරික ශ්‍රැතිය, තර්කය ආදියට වහල් නොවී නිදහස්ව සිතා විමසා තමා විසින් ම යමක සත්‍ය අසත්‍යතාව දත යුතු බව උගන්වන කාලාම සූත්‍රය නිර්දේශ **නොකරන** කරුණ කුමක් ද?

(1) ලෝභ ද්වේශ මෝහාදිය කුසල් ද අකුසල් දැයි විමසා බැලීම.
(2) කුසලාකුසල කර්මයන්ගේ මතු ඵල විපාක සොයා බැලීම.
(3) නුවණැත්තවුන්ගේ ගැරහුම් ලැබේ දැයි සොයා බැලීම.
(4) සිය කැමැත්ත අනුව ම කුසල් අකුසල් තීරණය කිරීම.
(5) නුවණැත්තවුන් පසසන්නේ දැයි විමසීම.

**11.** බුදුසමයේ ප්‍රභවයට සමාන්තරව භාරතයේ නැගී ආ විවිධ ගුරුකුලවලට අයත් ශ්‍රමණ කොටස් අතර දක්නට ලැබුණු පොදු ලක්ෂණයක් නම්,

(1) දේව විශ්වාසය පිටු දැකීම ය.
(2) ආශ්‍රම ධර්ම පිළිගැනීම ය.
(3) යාග විධි අනුමත කිරීම ය.
(4) වේදය ගුරු තන්හි තබා ගැනීම ය.
(5) බ්‍රහ්ම සහව්‍යතාව සොයා යාම ය.

**12.** මහා ප්‍රජාපතී ගෝතමිය ප්‍රමුඛ කාන්තාවන් පැවිද්ද ලබා ගැනීමත් සමග භික්ෂුණී සමාජය ආරම්භ විය. එහි දී භික්ෂුණීන් සඳහා බුදුරදුන් විසින් පනවා වදාළ ගරු ධර්ම අතුරින් එකක් නම්,
(1) භික්ෂූන්ට පිදූ සිවුපසය භික්ෂුණීන්ට පරිහරණය කළ නොහැකි ය යන්නයි.
(2) භික්ෂුණියක දහම් දෙසන තැනට භික්ෂූන් නොපැමිණිය යුතු ය යන්නයි.
(3) වස් වසා වැඩ සිටි භික්ෂුණීන් වස් අවසන උභතො සංඝයා ඉදිරියේ පවාරණය කළ යුතු ය යන්නයි.
(4) භික්ෂූන්ගේ ආවාස සමීපයෙහි භික්ෂුණීන් වාසය නොකළ යුතු ය යන්නයි.
(5) භික්ෂුණීන්ට ලැබෙන සිවුපසය ඉඳින් කැමති නම් භික්ෂූන්ට පූජා කළ හැකි ය යන්නයි.

**13.** බුදුරජාණන් වහන්සේ විසින් විවිධ කරුණු මුල් කොටගෙන විටින් විට අනුදැන වදාරන ලද උපසම්පදා ක්‍රම අටක් විනය මූලාශ්‍රයවල දැකගත හැකි ය. ඒ අතුරින් ඤත්ති චතුත්ථ කම්ම උපසම්පදාව යනු,
(1) සිවුවනක් පිරිස ම රැස්කොට කරන උපසම්පදාවයි.
(2) උපාධ්‍යායවරයෙකු නැතිව සිදු කළ හැකි උපසම්පදාවයි.
(3) භික්ෂුණීන් උපසම්පදා කිරීමට පමණක් යොදාගත යුතු ක්‍රමයකි.
(4) ඤත්තිය සිව්වැනි කොට කර්ම වාක්‍යය තෙවරක් කීමෙන් සිදු කරන උපසම්පදාවයි.
(5) ප්‍රශ්න හතරක් අසා පිළිතුරු ලබා ගැනීමෙන් පසු සිදු කෙරෙන උපසම්පදාවයි.

**14.** නවක පැවිද්දෙක් උපසම්පදාවට පත්වීමෙන් පසු සඟ මැද දී උන්වහන්සේට අවවාද වශයෙන් සිහිපත් කරන්නේ කුමක් ද?

| | | |
|---|---|---|
| (1) සේඛියා | (2) සතර පරාජිකාපත්ති | (3) දස දඬුවම් වත් |
| (4) අන්තේවාසික වත් | (5) ඕවාද ප්‍රාතිමෝක්ෂය | |

**15.** සෝවාන් ආදි සතරමග සතරඵලයට පැමිණි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක වූ සංඝරත්නය නව ගුණයකින් යුක්ත වන අතර එහි සුපටිපන්න යන්නෙන් අදහස් කරන්නේ,
(1) කාමසුඛල්ලිකානුයෝගයට හෝ අත්තකිලමථානුයෝගයට නොපැමිණි යන්නයි.
(2) දුරසිට වුව ද ගෙන ගොස් දානාදී ප්‍රත්‍ය පිළිගැන්වීමට සුදුසු ය යන්නයි.
(3) ආදර ගෞරවයෙන් යෝග්‍ය ලෙස පිළිවෙත් පුරන යන්නයි.
(4) මනා පිළිවෙතට එළඹගත් යන්නයි.
(5) ඍජු මාර්ගයට පිළිපන් යන්නයි.

**16.** බමුණු පූජකයන් විසින් ප්‍රචලිත කරන ලද ඉගැන්වීම් දීර්ඝ කාලයක් තිස්සේ භාරතීය ජන ජීවිතයට බල පෑවේ ය. එබඳු ඉගැන්වීමක් **නොවන** කරුණ කුමක් ද?
(1) ආත්මවාදී වීම.
(2) ඉෂ්ටාපූර්තය පිළිබඳ ඉගැන්වීම.
(3) තරුණ වියේදී පස්කම් සුව විඳීම.
(4) කේවලත්වය විමුක්තිය ලෙස පිළිගැනීම.
(5) වෛශ්‍යයන් ගොවිතැනෙහි නිරත වීම.

**17.** බුදුරදුන් විසින් බ්‍රාහ්මණ ඉගැන්වීම් විචාරයට ලක් කළ එක් අවස්ථාවක් නම්,
(1) "චත්තාරො වණ්ණා සමසමා" යන්නයි.
(2) "බ්‍රාහ්මණාව සුජ්ඣන්ති නො අබ්‍රාහ්මණා" යන්නයි.
(3) "සබ්බං ඉස්සර නිම්මාණ හේතු" යන්නයි.
(4) "තිණ්ණං වේදානං පාරගූ" යන්නයි.
(5) "බ්‍රාහ්මණෝ ව සෙට්ඨො වණ්ණො" යන්නයි.

**18.** බුද්ධකාලීන ෂට් ශාස්තෘවරුන් අතර සතරමහා භූතයන්ගෙන් හටගත් මේ ශරීරය මරණින් අවසන් වේ යැයි ද මතු උපතක් නැතැයි ද ඉගැන්වූයේ කවුරුන් විසින් ද?

| | |
|---|---|
| (1) නිගණ්ඨ නාතපුත්ත | (2) මක්ඛලී ගෝසාල |
| (3) අජිත කේසකම්බල | (4) පකුධ කච්චායන |
| (5) සංජය බෙල්ලට්ඨිපුත්ත | |

**19.** නිගණ්ඨ නාතපුත්ත විසින් ඉදිරිපත් කරන ලද පූර්වකර්ම ගෙවා දැමීම පිණිස තමා විසින් තමාට ම කටුක දුක් පීඩා ලබාදීමේ පිළිවෙත අනවබෝධය නිසා කරන අර්ථ විරහිත ක්‍රියාවක් යැයි පෙන්වා දෙමින් බුදුරදුන් එම පිළිවෙත විචාරයට භාජනය කළේ,

| | |
|---|---|
| (1) සාමඤ්ඤඵල සූත්‍රයේ දී ය. | (2) දේවදහ සූත්‍රයේ දී ය. |
| (3) සිගාලෝවාද සූත්‍රයේ දී ය. | (4) උපාලි සූත්‍රයේ දී ය. |
| (5) සන්දක සූත්‍රයේ දී ය. | |

**20.** මහා බ්‍රහ්මයා විසින් සමාජය මවන ලද්දේය යන බමුණු මතයට ප්‍රතිචාර දක්වමින් සමාජය යනු හේතුඵල ධර්මය අනුව පරිණාමයට ලක්වූවකැයි පෙන්වා දෙන ප්‍රමුඛතම බුද්ධ දේශනාව වන දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයෙහි කියවෙන එක් කරුණක් නම්,
(1) තිරිසන් සතුන් පරිණාමය වීමෙන් මිනිසා බිහිවූයේ ය යන්නයි.
(2) සමාජ ගැටලුවලට එක ම හේතුව ආර්ථික විෂමතාවන් ය යන්නයි.
(3) ස්ත්‍රී පුරුෂ වෙනස උපන්නේ මිනිස් සමාජයේ ප්‍රභවයත් සමග ය යන්නයි.
(4) පරිණාමය තුළ ප්‍රථමයෙන් ප්‍රකට වූ දුසිරිත ප්‍රාණඝාතය වේ යන්නයි.
(5) මෙලොව පරලොව දෙකෙහි ම සත්ත්වයා විෂයෙහි ධර්මය ශ්‍රේෂ්ඨ වේ යන්නයි.

**21.** සත්ත්වයා පිළිවෙතින් පිරිහෙන කල්හි, සද්ධර්මය ඔවුන් වෙතින් අතුරුදහන් වන කල්හි ශික්ෂා පද බහුල වෙයි. රහත් බව ලබන්නෝ ද අල්ප වෙති. බුදුරදුන් විසින් මෙම දේශනාව පවත්වන ලද්දේ,
(1) භද්දාලි තෙරුන්ට ය.
(2) ආනන්ද තෙරුන්ට ය.
(3) මහාකාශ්‍යප මාහිමියන්ට ය.
(4) සැරියුත් මාහිමියන්ට ය.
(5) මොග්ගලීපුත්තතිස්ස හිමියන්ට ය.

**22.** ශ්‍රාවක ශ්‍රාවිකාවන් ධර්මදූත කටයුතුවලට යොමු කිරීම හා එහි ලා ඔවුන් වඩාත් උනන්දු කරවීම පිණිස බුදුරජාණන් වහන්සේ බොහෝ පියවර ගත් බවට නිදසුන් සැපයිය හැකි ය. එබඳු එක් පියවරක් වන්නේ,
(1) ශ්‍රාවක දේශනා අගය කිරීම ය.
(2) වනපොත් කිරීමට අනුදැනීම ය.
(3) වැදගත් දහම් කරුණු පාඩම් ගැනීම ය.
(4) ධර්ම කරුණු ලියා ගැනීමට ශ්‍රාවකයන් පෙලඹවීම ය.
(5) වරදවා තේරුම්ගත් ශ්‍රාවකයන්ට විනයානුකූලව දඬුවම් දීම ය.

**23.** ස්වකීය ශ්‍රාවක ශ්‍රාවිකාවන් දිරිමත් කිරීමේ හා අගය කිරීමේ අරමුණ ඇතිව බුදුරජාණන් වහන්සේ අග තනතුරු ප්‍රදානය කළහ. මහමුගලන් මාහිමියන්ට හිමි වූ අග තනතුර නම්,
(1) ධූතාංගධාරීන් අතර අග තනතුරයි.
(2) ඍද්ධිමතුන් අතර අග්‍රස්ථානයයි.
(3) මධුරස්වර ඇත්තවුන් අතර අග තනතුරයි.
(4) ශික්ෂාකාමී ශ්‍රාවකයන් අතර අග්‍රස්ථානයයි.
(5) සසුනේ වෘද්ධතර භික්ෂූන් අතර අග තනතුරයි.

**24.** සම්බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ඇවෑමෙන් පැවැති ධර්ම සංගායනාවේ දී ධර්ම විනයෙහි චිර පැවැත්මත් සංඝසාමග්‍රිය හා දුර්මත බැහැර කිරීමත් පිණිස ජ්‍යෙෂ්ඨ භික්ෂූන්ගේ මූලිකත්වයෙන් ගන්නා ලද පියවර කුමක් ද?
(1) කුඩා අනුකුඩා ශික්ෂාපද තීරණය කිරීම.
(2) දුසිල් මහණුන් සසුනෙන් නෙරපා හැරීම.
(3) අභද්‍ර වචන ප්‍රකාශ කළ සුභද්‍ර භික්ෂුවට තදින් අවවාද කිරීම.
(4) විශේෂඥ මහතෙරුන්ගෙන් විමසා පිරිසිදු ධර්ම විනය කුමක් දැයි තීරණය කිරීම.
(5) චෝදනා පහකට ලක් වූ ආනන්ද හිමියන්ට දඬුවම් පැමිණවීම.

**25.** තෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට මොග්ගලීපුත්තතිස්ස හිමියන් ඇතුළු ශාසනභාරධාරී මහ තෙරවරුන් පෙළඹීමට හේතුවීයැයි යැයි සැලකිය හැකි කරුණු අතුරින් එකක් නම්,
(1) දුර්භික්ෂයක් ඇතිවීම ය.
(2) රහතුන්ගේ තත්ත්වය පිළිබඳ වැරදි අදහස් පැතිරීම ය.
(3) සසුන්ගත වූ තීර්ථකයන් ධර්මාශෝක රජු පහදවා ගැනීම ය.
(4) විනයධර භික්ෂූන් ධර්මධර භික්ෂූන්ට විවිධ චෝදනා නැගීම ය.
(5) ධර්ම විනය පිළිබඳ දුර්මතවලට පිළිතුරු දීමේ අවශ්‍යතාව ඇතිවීම ය.

**26.** "යම් සේ අංගෝපාංග සම්භාරයකට රථය යැයි කියනු ලබන්නේ ද එසේ ම රූප වේදනා දී ස්කන්ධ පඤ්චකයෙහි එකතුවට සත්ත්වයා යැ'යි සම්මුතියක් පවතී." පඤ්චස්කන්ධය යනු,
(1) සත්ත්වයාගේ ආත්මයයි.
(2) පරමාර්ථ ධර්ම සමූහයෙකි.
(3) ආත්ම ස්වරූපයෙන් තොර ස්කන්ධ පහකි.
(4) පටිච්චසමුප්පන්න නොවන ධර්ම සමූහයෙකි.
(5) එකිනෙකට සම්බන්ධයක් නැති ධර්ම සම්භාරයෙකි.

**27.** "අටලෝ දහම අස්ථිර ය. විපරිණාමී ය. එයින් කම්පාවට පත් නොවිය යුතු ය. ඒ පිළිබඳ අවබෝධයෙන් ජීවිතය පවත්වාගෙන යා යුතු ය" යන අර්ථය ප්‍රකාශ **නොවන** ධර්ම පාඨය කුමක් ද?
(1) 'චිත්තං යස්ස න කම්පති'
(2) 'එතෙ අනිච්චා මනුජෙසු ධම්මා'
(3) 'න තෙ හවං අට්ඨමං ආදියන්ති'
(4) 'චතුබ්භි වාතෙහි අසම්පකම්පියො'
(5) 'එවං නින්දා පසංසාසු න සමිඤ්ජන්ති පණ්ඩිතා'

**28.** සියලු ධර්මයන් අනිත්‍ය බැවින් දුක් සහිත ය. එබැවින් අනාත්මය යන සත්‍යය අවබෝධ කරගත් තැනැත්තා,
(1) ශ්‍රද්ධාවන්තයෙකු වෙයි.
(2) වීර්යවන්තයෙකු වෙයි.
(3) බොහෝ පින් රැස්කර ගනියි.
(4) මරණින් මතු සැප ලබාගනියි.
(5) සංස්කාර ධර්ම කෙරෙහි කලකිරෙයි.

**29.** බෞද්ධ ජීවිතයක ප්‍රකට වියයුතු මූලික සද්ගුණ බඹ විහරණ නමින් හැඳින්වෙයි. එම සද්ගුණ හඳුන්වන තවත් ධර්මානුකූල ව්‍යවහාරයක් නම්,
(1) චතුඅප්පමඤ්ඤා යන්නයි.
(2) චතුපටිසම්භිදා යන්නයි.
(3) චතුරාරක්ඛා යන්නයි.
(4) චතුපාරිසුද්ධි යන්නයි.
(5) චත්තාරො සම්මප්පධානා යන්නයි.

**30.** පාරිසරික සම්පත් හිතවාදී බවින් තොරව අසීමිත තෘෂ්ණාවෙන් අනිසි ලෙස පරිභෝග කිරීමෙන් ලැබෙන දුර්විපාක රැසක් අග්ගඤ්ඤ සූත්‍රයේ පැහැදිලි කර තිබේ. ඉන් එකක් නම්,
(1) ජල උල්පත් සිඳී යාමයි.
(2) ආයු වර්ණාදිය පිරිහීයාමයි.
(3) රෝගාබාධයන් වැඩිදියුණු වීමයි.
(4) වියලි කාලගුණයක් ඇතිවීමයි.
(5) වායු දූෂණය පැතිර යාමයි.

**31.** බුදුදහම අනුව සසර දුක තුන් ආකාර ය. එනම් දුක්ඛ දුක්ඛතා, විපරිණාම දුක්ඛතා හා සංඛාර දුක්ඛතා යනුවෙනි. මෙහි දුක්ඛ දුක්ඛතා යනු,
(1) ජාති ජරා ව්‍යාධි මරණාදී දුක් ය.
(2) වෙනස්වීම පිළිබඳ දුක ය.
(3) පීඩාජනක වූ දුක් දොම්නස් ය.
(4) හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගන්නා දුක් ය.
(5) මානසිකව විඳීමට සිදු වන දුක් පීඩාවන් ය.

**32.** මිනිස් සන්තානගතව මුල්බැසගත් තණ්හාව දුක්ඛ සමුදයාර්ය සත්‍යයෙන් පැහැදිලි කෙරේ. එහි භව තණ්හා යන්නෙන් කියවෙන්නේ,
(1) ඉඳුරන් පිනවීමේ තෘෂ්ණාව ය.
(2) පස්කම් සුවයට ඇති කැමැත්ත ය.
(3) ශාස්වත දෘෂ්ටියෙන් උපදනා තණ්හාව ය.
(4) උච්ඡේද දෘෂ්ටියෙන් උපදනා තෘෂ්ණාව ය.
(5) නිත්‍ය ආත්මයක් නැතැයි පිළිගනිමින් මෙලොව සැප විඳීමේ ආශාව ය.

**33.** සම්මා සමාධිය ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි සමාධි ශික්ෂාවට ඇතුළත් වන අතර එම මාර්ගාංගය වැඩීමෙන්,
(1) ආකාසානඤ්චායතනය උපදවා ගත හැකි ය.
(2) ඉද්ධිවිධ ඤාණය උපදවා ගත හැකි ය.
(3) ආසවක්ඛය ඤාණය ලබාගත හැකි ය.
(4) චතුර්විධ ධ්‍යාන ලබාගත හැකි ය.
(5) දිබ්බසොත ඤාණය උපදවා ගත හැකි ය.

**34.** "යො පටිච්චසමුප්පාදං පස්සති, සො ධම්මං පස්සති" පටිච්චසමුප්පාදය දකින්නා ධර්මය දකියි. මෙම ධර්ම පාඨය ඇතුළත් වන්නේ,
(1) මහාහත්ථිපදෝම සූත්‍රයේ ය.
(2) දම්සක් පැවැතුම් සූත්‍රයේ ය.
(3) මහාතණ්හාසංඛය සූත්‍රයේ ය.
(4) වජිරා සූත්‍රයේ ය.
(5) මහානිදාන සූත්‍රයේ ය.

**35.** අනුලෝම පටිච්චසමුප්පාද දේශනාවෙහි ජරාමරණාදි සංසාරගත දුක්ඛ දෝමනස්සයන්ගේ සමුදයට තුඩුදෙන එක් ප්‍රත්‍යයක් සංස්කාර නමින් දැක්වෙන අතර ඉන් අර්ථවත් වන්නේ,

(1) පඤ්චස්කන්ධයයි.
(2) ඡන්ද රාගයයි.
(3) සචේතනික ක්‍රියාවයි.
(4) නාමරූප ධර්ම සන්තතියයි.
(5) මිච්ඡා සංකප්පයයි.

**36.** මිනිසාගේ ස්වාමියා මිනිසා ම ය යන බෞද්ධ ඉගැන්වීමට ප්‍රතිවිරුද්ධ බුද්ධ කාලීන ආගමික ඉගැන්වීමක් වන සර්ව බලධාරී ඊශ්වරයෙකු පිළිබඳ ඉගැන්වීම සමග බුදුදහම එකඟ **නොවන** හේතුව කුමක් ද?

(1) එය සාම්ප්‍රදායික බමුණු මතයක් වීම.
(2) බොහෝ ශ්‍රමණයන් විසින් එය බැහැර කිරීම.
(3) බුදුරදුන්ට හිමි ශ්‍රේෂ්ඨත්වය නොපිළිගැනීම.
(4) තර්කානුකූලව ඔප්පු කළ නොහැකි වීම.
(5) මානව ශක්‍යතාව එමගින් හෑල්ලුවට ලක්වීම.

**37.** පුද්ගලයාගේ කායික මානසික ශක්‍යතා සංවර්ධනය කරගැනීමෙන් ත්‍රිවර්ග සම්පත්තිය ම උදාකරගත හැකි බව පිළිගන්නා බුදුසමය තුළ එකී ශක්‍යතා අර්ථවත් කරන ව්‍යවහාරය වන්නේ කුමක් ද?

(1) සති (2) ඣාන (3) උපධි (4) පදාන (5) සරණ

**38.** "යම් කර්මයක් තමාට, අනුන්ට හා දෙපක්ෂයට ම දුක් පිණිස වේද එය අකුසලයකි. යම් කර්මයක් දෙපක්ෂයට ම දුක් පිණිස නොවේද එය කුසලයකි." මෙම බුද්ධ වචනය දක්නට ලැබෙන්නේ,

(1) නිබ්බේධික සූත්‍රයේ ය.
(2) චූළකම්මවිභංග සූත්‍රයේ ය.
(3) වීමංසක සූත්‍රයේ ය.
(4) ධම්මචේතිය සූත්‍රයේ ය.
(5) අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයේ ය.

**39.** බුදුදහම අනුව යහපත් කර්ම, කුසල කර්ම සහ පුණ්‍ය කර්ම යැයි දෙයාකාර වෙති. මෙහි පුණ්‍ය කර්මයක් වන්නේ කුමක් ද?

(1) සතුන් නොමැරීම.
(2) කේලාම් කීමෙන් වැළකීම.
(3) ධර්මය දේශනා කිරීම.
(4) දැඩි ලෝභයෙන් වෙන්වීම.
(5) හිස් වචන නොදෙඩීම.

**40.** බුදුදහමෙහි ඉගැන්වෙන ශ්‍රද්ධා ගුණය නිවැරදිව හඳුන්වා දෙන ප්‍රකාශය වන්නේ,

(1) තෙරුවන් පිළිබඳ භක්තිය ශ්‍රද්ධාව ය යන්නයි.
(2) ශ්‍රද්ධාව ඉන්ද්‍රියක් ලෙස ද දක්වා තිබේ යන්නයි.
(3) ශ්‍රද්ධාව ගිහියන්ට මිස පැවිද්දන්ට අදාළ නොවේ යන්නයි.
(4) අමූලක ශ්‍රද්ධාව ඇත්තේ රහතන් වහන්සේලා තුළ ය යන්නයි.
(5) ශ්‍රද්ධාව මුල්වන්නේ පින්දහම් කිරීමට මිස පිළිවෙත් පිරීමට නොවේ යන්නයි.

**41.** අංගුත්තර නිකායේ කුල සූත්‍රය අනුව පවුල් ඒකකයක අභිවෘද්ධිය කැමති වන්නෙකු විසින් කළ යුතු යැයි දක්වන කරුණක් වන්නේ කුමක් ද?

(1) ධාර්මික ජීවනෝපායක නිරත වීම.
(2) උපයාගත් සම්පත් හොඳින් රැක ගැනීම.
(3) නැසෙන දේ නැවත සොයා ගැනීම.
(4) මවුපිය ගුරුවරුන්ට යුතුකම් ඉටු කිරීම.
(5) සුදුසු අවස්ථාවේ දී පරිත්‍යාගශීලී වීම.

**42.** උපයාගත් ධනය ඇත්තවුන් විසින් තමාගේ යහපත පිණිස මෙන් ම අනුන්ගේ යහපත පිණිස ද එම ධනය යෙදවිය යුතු බව බුදුදහම පෙන්වා දෙයි. ඒ අනුව අතිථිබලි යන්නෙන් හඳුන්වන්නේ,

(1) ආගමික උතුමන් වෙනුවෙන් යුතුකම් ඉටු කිරීම ය.
(2) අඹුදරු මාපියාදීන්ට සංග්‍රහ කිරීම ය.
(3) මලගිය අයට පින්පෙත් දීම ය.
(4) ආගන්තුකයන්ට සැලකීම ය.
(5) මිතුරන්ට උපකාර කිරීම ය.

**43.** දීඝ නිකායේ කූටදන්ත සූත්‍රයට අනුව රජුන් විසින් ජනතාව ආර්ථික සමෘද්ධිය වෙත යොමු කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග අතුරින් එකක් නම්,
(1) අඩුමිලට ඉඩම් ආදිය ලබාදීම ය.
(2) නිබඳව විශේෂඥ උපදෙස් ලබාදීම ය.
(3) විදේශ වෙළඳාමට අවස්ථා සැලසීම ය.
(4) කර්මාන්ත ඇරඹීමට වෙනත් රටවලට ආරාධනා කිරීම ය.
(5) සුදුස්සන් සුදුසු රාජ්‍ය සේවාවල යොදවා නිසි වැටුප් ගෙවීම ය.

**44.** වජ්ජීන් විසින් සිය රාජ්‍යයෙහි පිරිහීම වළක්වා දියුණුව ඇති කර ගැනීම පිණිස අනුගමනය කළ සප්ත අපරිහානීය ධර්ම අතුරින් එකක් නම්,
(1) සිය කාලය, ශ්‍රමය හා ධනය පරිත්‍යාගශීලීව ප්‍රජාව වෙනුවෙන් යෙදවීම ය.
(2) නිර්ධනයන්ට කර්මාන්තාදිය සඳහා ධනය ලබාදීම ය.
(3) සතර අගතියෙන් තොරව රාජ්‍ය පාලනය කිරීම ය.
(4) වැඩිහිටියන්ට ගරු කිරීම හා සවන් දීම ය.
(5) ප්‍රිය වචනයෙන් ප්‍රජාව ඇමතීම ය.

**45.** පෙර දඹදිව රාජ්‍ය පාලනය කළ එක් පාලකයෙකු සිය දේශයේ ආර්ථික සමෘද්ධියත්, සංස්කෘතික හා සාමයික අභිවෘද්ධියත් ඇති කිරීමට බොහෝ ක්‍රියාමාර්ග ගත් නමුදු අපරාධ මර්දනය සඳහා පියවර නොගත්තේ ය. බුද්ධදහම අනුව ඔහු විසින් කඩ කළ බව පෙනී යන්නේ,
(1) සතර අගති විරතියයි.
(2) සක්විති වතකි.
(3) අපරිහානීය ධර්මයකි.
(4) සංග්‍රහ වස්තුවකි.
(5) දසරාජධර්මවලින් එකකි.

**46.** ප්‍රාග් වෛදික යුගයේ පටන් භාරතීය මහණ බමුණන් අතර භාවනාව පිළිබඳ කිසියම් අවදිකමක් තිබූ බවට තොරතුරු හමුවන අතර බුද්ධසමය එහි ලා ඉදිරි පියවරක් ප්‍රකට කළ බව සැලකිය **නොහැකි** කරුණ කුමක් ද?
(1) රාගාදි කෙලෙස් යටපත් කිරීමට ඉගැන්වීම.
(2) සමථය ඉක්මවා විපස්සනාවට මග පෙන්වීම.
(3) නවවැනි සමාපත්තිය දක්වා ඉදිරියට යාම.
(4) ආසවක්ඛය ඥානය වෙත යොමුවීම.
(5) ප්‍රඥා ශික්ෂාව පෙන්වා දීම.

**47.** ආර්ය මාර්ගයෙහි සම්මා සමාධියට ඇතුළත් සතර සතිපට්ඨානයෙහි ධම්මානුපස්සනාව යනු,
(1) ධර්මය මනාකොට මෙනෙහි කිරීමයි.
(2) තම සිතෙහි නීවරණ ධර්ම ඇති නැති බව දැනගැනීමයි.
(3) ධර්ම රත්නයෙහි සිත් පහදවා ගැනීමයි.
(4) ජීවිතය ධර්මානුකූලව ගත කිරීමයි.
(5) අටලෝ දහමින් කම්පා නොවීමයි.

**48.** මේ ශරීරය පාදාන්තයේ සිට කේශාන්තය දක්වා සම කෙළවරකොට නා නා ප්‍රකාර වූ අසූචියෙන් යුක්ත යැයි නුවණින් සිහි කළ යුතු බව බුද්ධදහම උගන්වයි. එම සිත වැඩීමට උගන්වන්නේ,
(1) අසුභ භාවනාවේ දී ය.
(2) ආනාපානසති භාවනාවේ දී ය.
(3) වේදනානුපස්සනාවේ දී ය.
(4) දේවතානුස්සතියේ දී ය.
(5) විපස්සනා භාවනාවේ දී ය.

**49.** විශුද්ධි මාර්ගය උගන්වන පරිදි ආධ්‍යාත්මික ස්වභාවය අනුව පුද්ගල චරිත හයක් ඇති අතර එයින් මෝහ චරිතයාට සුදුසු භාවනාව ලෙස දක්වන්නේ,
(1) කායගතා සතියයි.
(2) ආනාපාන සතියයි.
(3) බ්‍රහ්ම විහාර භාවනාවයි.
(4) මරණානුස්සතියයි.
(5) බුද්ධානුස්සතියයි.

**50.** නිතර භාවනා කිරීම තුළින් ලබාගත හැකි අනුසස් රාශියක් බෞද්ධ මූලාශ්‍රයන්හි පෙන්වා දෙයි. ඒ අතර මෙත්තානුපස්සනාවේ ආනිසංසයක් ලෙස දක්වා ඇත්තේ,
(1) අපායගාමී නොවේ යන්නයි.
(2) පවට, ලජ්ජාව ඇති වේ යන්නයි.
(3) සම්මා දිට්ඨිය උපදියි යන්නයි.
(4) සුවසේ නිදයි යන්නයි.
(5) උන්මත්තකයෙකු නොවේ යන්නයි.

❋❋❋

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2020

නව නිර්දේශය/ புதிய பாடத்திட்டம்

විෂය අංකය / பாட இலக்கம்: 41 | විෂයය / பாடம்: බුද්ධ ධර්මය

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 1 | 21. | 1 | 31. | 1 | 41. | 3 |
| 02. | 3 | 12. | 3 | 22. | 1 | 32. | 3 | 42. | 4 |
| 03. | 5 | 13. | 4 | 23. | 2 | 33. | 4 | 43. | 5 |
| 04. | 3 | 14. | 2 | 24. | 4 | 34. | 1 | 44. | 4 |
| 05. | 5 | 15. | 4 | 25. | 5 | 35. | 3 | 45. | 2 |
| 06. | 1 | 16. | 4 | 26. | 3 | 36. | 5 | 46. | 1 |
| 07. | 3 | 17. | 1 | 27. | 3 | 37. | 4 | 47. | 2 |
| 08. | 5 | 18. | 3 | 28. | 5 | 38. | 5 | 48. | 1 |
| 09. | 2 | 19. | 2 | 29. | 1 | 39. | 3 | 49. | 2 |
| 10. | 4 | 20. | 5 | 30. | 2 | 40. | 2 | 50. | 4 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 02 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 50 = 100

# II පත්‍රය

## I කොටස

01.

(i) **'සුගත' බුදුගුණයට අර්ථ දක්වන්න.**

සසර දුකින් අත්මිදීම පිණිස වන මාර්ගයෙහි එනම් ආර්ය මාර්ගයෙහි මැනවින් ගමන් කල බැවින් ද සකල ක්ලේශයන් නිරවශේෂ වශයෙන් ප්‍රහීණ කල බැවින් ද බුදුරජාණන් වහන්සේ සුගත නම් වන බව.

*(ලකුණු 02)*

(ii) **ඉද්ධිවිධ ඥාණය හඳුන්වන්න.**

ඉද්ධිවිධ ඥාණය යනු සමථ භාවනාවේ ප්‍රතිඵල වශයෙන් උපදවා ගත හැකි ලෞකික අභිඥාවකි. එය බිඳවැටෙන සුළුය. එක් අයෙකුව නැවත බොහෝ දෙනෙකු වීම, බොහෝ දෙනෙකු වී නැවත එක් අයෙකු වීම, දෘෂ්‍යමාන හා අදෘශ්‍යමාන වීම, අහසින් යාම, පොළොවෙහි කිමි දීම, ජලයෙහි ඇවිදීම, ආදී විශේෂ ක්‍රියාකාරකම් පිළිබඳ හැකියාව මින් අදහස් වන බව

*(ලකුණු 04)*

(iii) **'බුදුරජාණන් වහන්සේ උත්තරීතර මනුෂ්‍යයෙකි.' පැහැදිලි කරන්න.**

බුදුරජාණන් වහන්සේ ගුණ නුවණින් ලෝකයෙන් අග්‍ර වන බැවින් ද, දෙටු වන බැවින් ද, ශ්‍රේෂ්ඨ වන බැවින් ද, උත්තරීතරය. මඩ දියෙහි උපන්නද, වැඩුනද, එහි නොගැටී ප්‍රසන්නව පිරිසිදුව විකසිත වූ නෙලුමක් මෙන් උන්වහන්සේ කෙලෙස් සහිත මිනිසුන් ඇති ලොව උපන්නද, මඩ නොගැවී නොතැවරී නිකෙලෙස්ව වැඩ සිටි බැවින් උත්තරීතරය. නව අරහාදී බුදුගුණ වලින් ද උන්වහන්සේගේ උත්තරීතර බව කියවේ.

*මෙම කරුණු 03 සඳහා ලකුණු ප්‍රදානය කරන්න. (ලකුණු 06)*

(iv) **පටිපුච්ඡා ව්‍යාකරණ ක්‍රමය සනිදර්ශනව විමසන්න.**

තමන් වහන්සේ වෙත පැමිණි අයෙකු ප්‍රශ්නයක් ඇසූවිට එයට පිළිතුරු දීම වෙනුවට ඔහුගෙන් ආපසු ප්‍රශ්නයක් ඇසීම තුළින් ගැටළුව විසඳීම මින් අදහස් වන බව. එසේ ප්‍රතිප්‍රශ්න නැගීම සච්චක පඩිවරයා සමඟ කළ සාකච්ඡාවෙන් ද, අග්ගිවච්චගොත්ත පිරිවැජියා සමඟ කල සාකච්ඡාවෙන් ද, උපාලි ගෘහපති, අභයරාජ කුමරු ආදීන් සමඟ කළ සාකච්ඡා වලින් ද හෙළිවන බව.

*මෙවැනි නිදසුන් 02ක් මඟින් පිළිතුරු සපයා තිබිය යුතුය. (ලකුණු 08)*

02.

(i) **'විනය' යන්නට නිර්වචන සපයන්න.**

විනය යන්නෙහි සරල අර්ථය හික්මීම යන්නයි. නොයෙක් විශේෂ නය ක්‍රම ඇති බැවින් ද විනය යයි කියනු ලැබේ.

***(ලකුණු 02)***

(ii) **'සන්දිට්ඨික' දහම් ගුණය හඳුන්වා දෙන්න.**

තමා විසින්ම මෙලොවදීම දැන ගත හැකි බැවින් ධර්මය සන්දිට්ඨික වන බව. රාග ද්වේශ මෝහාදී කෙලෙස් තමා තුළ ඇති බව හෝ නැති බව දැනීම යන අර්ථය ද දක්වා තිබීම.

***(ලකුණු 04)***

(iii) **'වීමංසක' සූත්‍රාගත විමසීමේ නිදහස විස්තර කරන්න.**

වීමංසක යනු නිදහස්ව නිවහල්ව විමසීම යන්නයි. වීමංසක සූත්‍රය අනුව පරසිත් දැක ගැනීමේ හැකියාව නැති ශ්‍රාවකයාට බුදුරදුන්ගේ කායික හා වාචසික සමාචාරයන් විමසා බැලිය හැකිය. එසේ නොවිමසා ශාස්තෘවරයා ගැන වුව ද තීරණ ගැනීම නුසුදුසුය. මෙසේ ශාස්තෘවරයා ගැන වුව ද විමසීමට දී ඇති නිදහස බුදු දහමට සුවිශේෂ වූවක් බව.

*මෙම කරුණු වලින් 03 වත් විස්තර විය යුතුය. (ලකුණු 06)*

(iv) **විමුක්ති මාර්ගයක් ලෙස බුදුසමය ඇගයුමට ලක් කරන්න.**

තම විමුක්තිය පාර භෞතික බලවේගයකට පවරා නොදෙන එය තමා විසින්ම උදාකර ගත යුතු යැයි ඉගැන්වෙන ධර්ම මාර්ගයක් ලෙස ද, විශ්වාසයක් ඇදහිල්ලක් තුළින් නොව යථාර්තය ප්‍රත්‍යක්ෂයෙන් දැක තමාම විමුක්තිය ලඟා කර ගත යුතු යැයි උගන්වන ධර්ම මාර්ගයක් ලෙස ද, අනුපූර්ව ලක්ෂණ සහිත ත්‍රිශික්ෂාව පිරීමෙන් අත්දැකීමක් ලෙස පසක් කළ යුතු විමුක්තියක් උගන්වන දහමක් ලෙස ද, දර්ශනයක් හා චරණයක් වශයෙන් අන්තගාමී නොවන ධර්ම මාර්ගයක් ලෙස ද, බුදුසමයෙහි අගය පෙන්වා දීම.

***(ලකුණු 08)***

03.

(i) **බුද්ධකාලීන ශ්‍රමන ගුරුකුල දෙකක් නම් කරන්න.**

ජටිල, පරිබ්‍රාජක, ආජීවක නිගණ්ඨ, අචේලක ආදී බුද්ධ කාලීන ශ්‍රමන ගුරුකුල අතුරින් දෙකක් නම් කිරීම. මෙහි දී මෙම නම් වලින් හැඳින්වෙන්නේ ගුරුකුල වන බව තේරුම්ගෙන තිබීම වැදගත්ය.

*(ලකුණු 02)*

(ii) **'උත්තරිමනුස්සධම්ම' පාරාජිකය යනු කුමක්දැයි දක්වන්න.**

තමා තුළ නැති ගුණ ඇතැයි පැවසීම, එසේ හැඟවීම මින් අදහස් වන බව. සතර පරාජිකා අතුරින් එකක් වන මෙය සම්පූර්ණ වීමට නම්, මම මෙය දකිමි. දනිමි යනාදී වශයෙන් තමා තුළ ධ්‍යාන අභිඥා ආදී උත්තරීතර මිනිස් ගුණ ඇතැයි දැන දැන බොරු කීම ඇඟවීම මින් අදහස් වන බව.

*(ලකුණු 04)*

(iii) **විනය ශික්ෂාවන් පැනවීමේ පරමාර්ථ පැහැදිලි කරන්න.**

පාරාජිකපාළියට අනුව කරුණු දහයක් සළකාගෙන බුදුරදුන් විසින් විනය නීති පනවා තිබේ. සංඝයාගේ හිතසුව, පහසුව, දුසිල් පුද්ගලයන්ට නිග්‍රහ කිරීම, සිල්වතුන්ගේ පහසුව ආදී කරුණු අතුරින් හයක් දක්වා අර්ථය පැහැදිලි කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ.

*(ලකුණු 06)*

(iv) **භික්ෂු ජීවිතයට අදාළ බ්‍රහ්මචර්යාව පිළිබඳ විමසුමක් කරන්න.**

යාවජීව වශයෙන් බඹසර රැකීම භික්ෂු ජීවිතයට අදාල වන බව, එනම් විරුද්ධ ලිංගිකයන් සමඟ ඇසුරකින් තොරව බ්‍රහ්මචාරීව ජීවත් වීම මෙහි මූලික අර්ථය වන බව. ගිහි ජීවිතයට අදාළ වන්නේ කාමමිථ්‍යාචාරයෙන් වැළකීම පමණක් වුව ද භික්ෂු ජීවිතයට අබ්‍රහ්මචර්යාවෙන් වැළකීම අදාළ වන බව, බුදුසමයෙහි පිරිසිදු පිරිපුන් බඹසර උගන්වන බව.

*(ලකුණු 08)*

## II කොටස

04.

(i) **නාස්තිකවාදය පිළිබඳ ප්‍රමාණවත් විස්තරයක් කරන්න.**

මෙලොව, පරලොව, පින් පවු, ඵල විපාක කිසිවක් නැතැයි ඉගැන්වීම නාස්තිකවාදය ලෙස හැඳින්වෙන බව. බුද්ධ කාලීනව විසූ පූර්ණ කාශ්‍යප, අජිත කේසකම්බල, පකුධ කච්චායන වැනි ශාස්තෘවරුන් නාස්තිකවාදීන් වූ බව, ඔවුන් පින් පවු මෙන්ම විපාකද නොපිළිගැනීමෙන්, පරලොව ප්‍රතික්ෂේප කිරීමෙන් නාස්තිකවාදයක් ඉගැන් වූ බව.

*(ලකුණු 08)*

(ii) **ඒ පිළිබඳ බෞද්ධ විචාරය ගෙනහැර දක්වන්න.**

බුදු දහම කුසලාකුසල කර්ම හා එහි ඵලවිපාක නොපිළිගැනීම මිථ්‍යා දෘෂ්ටියෙකැයි උගන්වන බව. නාස්තිකවාදය උච්ඡේද දෘෂ්ටියෙන් මතු වන අතර බුදු සමය එම දෘෂ්ටිය පසෙකින් තබන බව. කර්ම විපාක මෙන්ම පරලොව ද තරවුරු කරමින් බුදුරදුන් විසින් හේතුඵල දහම දේශනා කොට ඇති බව.

*(ලකුණු 12)*

05.

(i) **ආත්මාවාදය යනු කුමක්දැයි හඳුන්වන්න.**

නිත්‍ය ආත්මයක් ඇතැයි කීම ආත්මවාදය වන බව. මම, තමා. සත්වයා, පුද්ගලයා යනුවෙන් සළකාගත හැකි භවගාමී නිත්‍ය සත්‍යයක් පිළිගැනීම ආත්මවාදය යන්නෙන් අදහස් වන බව. එබඳු ආත්මයක් ඇතැයි වෛදික බ්‍රාහ්මණයන් මෙන්ම සාංඛ්‍ය, ජෛන, උපනිෂද් චින්තකයන් ද පිළිගෙන තිබූ බව.

*(ලකුණු 08)*

(ii) **'සබ්බෙ ධම්මා අනත්තා' විමසන්න.**

''සබ්බේ ධම්මා'' යන්නෙන් ස්කන්ධ, ධාතු, ආයතන ආදී නාම රූප ධර්ම හෙවත් සත්වයා හා ලෝකය සෑදී ඇති මූල සාධක අදහස් වන අතර ඒ සියල්ල අනිත්‍ය බැවින් දුක් සහිතය. එබැවින් අනාත්ම යැයි බුදුදහමේ ඉගැන්වෙන බව. ඒ අනුව නිත්‍ය සත්‍ය භව සංක්‍රමණික ආත්මයක් නැතැයි යන්න මෙම පාඨයේ මූලික අදහස වන බව.

*(ලකුණු 12)*

06.

(i) **ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ලෞකික උපයෝගීතාව පෙන්වා දෙන්න.**

ආර්ය අෂ්ඨාංගික මාර්ගය යනු නිවන් මඟයි. එය ලෝකෝත්තර අරමුණක් වෙත යොමු වී ඇතත් ලෞකික වශයෙන් එයින් කියවෙන ශීල ශික්ෂාවෙන් සදාචාර සම්පන්න සමාජයක් ඇති කරමින් සමාධි ශික්ෂාවෙන් දියුණු සිත් සතන් ඇති මිනිසුන් බිහි කරමින් ප්‍රඥා ශික්ෂාවෙන් නුවණැති මිනිසුන් සහිත සමාජයකට මඟ පෙන්වන බව. දස අකුසල් වලින් වැළකී නිවුණු සිත් ඇතිව සාමකාමීව ජීවත් වීමට ආර්ය මාර්ගය අනුගමනය කිරීම උපකාරී වන බව.

*(ලකුණු 08)*

(ii) **සම්මා වායාමය ධර්මානුකූලව පැහැදිලි කරන්න.**

සම්මා වායාම යනු නිවැරදි ව්‍යායාමය හෙවත් උත්සාහය වන බව, එනම් නූපන් අකුසල් නොඉපදවීමට වැයම් කිරීම, උපන් අකුසල් දුරු කිරීමට වැයම් කිරීම, නූපන් කුසල් ඉපදවීමට වැයම් කිරීම සහ උපන් කුසල් වැඩිදියුණු කිරීමට වැයම් කිරීමයි.

*මෙම කරුණු හතර ඇතුළත්ව පිළිතුර සකස්විය යුතුය. (ලකුණු 12)*

07.

(i) **අවිධිමත් රාජ්‍ය පාලනයකින් ඇති වන සමාජ ආර්ථික ගැටලු පැහැදිලි කරන්න.**

චක්කවත්තිසීහනාද සූත්‍රාගත වෘත්තාන්තය අනුව සත්වැනි සක්විති රජු පෙර පැවති සක්විතිවත් අනුගමනය නොකිරීම නිසා දිළිඳු බව, හොරකම, ප්‍රාණඝාතය ආදිය ඇති වීම. කූටදන්ත සූත්‍රය අනුව රජු සමාජ ආර්ථික දියුණුවට අවශ්‍ය පියවර නොගැනීමෙන් හා අනිසි ලෙස බදු අයකිරීමෙන් දස්සුඛීලය ඇති වීම වැනි කරුණු අතුරින් පිළිතුරු සකස් විය යුතුය.

*(ලකුණු 08)*

(ii) **එම ගැටලු වලට බුදුසමය සපයන ප්‍රායෝගික විසඳුම් පෙන්වා දෙන්න.**

පුද්ගල කේන්ද්‍රීය වශයෙන් ආර්ථික දියුණුව ඇති කර ගැනීමට උපදෙස් දෙන ව්‍යග්ගපජ්ජ, ,පත්තකම්ම, රාසිය වැනි සූත්‍ර ඇසුරින් කරුණු සැකෙවින් දැක්වීම.

*(ලකුණු 12)*

08.

(i) **බෞද්ධ භාවනාවේ සුවිශේෂත්වය ගෙනහැර දක්වන්න.**

බුද්ධ කාලීන මහණ බමුණන් විසින් ද භාවනාව ඉගැන් වූ බව. එහෙත් ඔවුන් සමථ භාවනාව සහ එහි ප්‍රතිඵල ද ඉක්මවා නොගිය බව. බුදුසමය භාවනාවේ ලෞකික ප්‍රතිඵල ඉක්මවා විපස්සනාව වෙත යොමු වූ බව. ආසවක්ඛය ඥානය, සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තිය වැනි ප්‍රතිඵල වෙත යොමු වීම සුවිශේෂතාව වන බව.

*(ලකුණු 08)*

(ii) **ආනාපානාසති භාවනාව සූත්‍රානුසාරයෙන් පැහැදිලි කරන්න.**

ආස්වාස - ප්‍රස්වාස ක්‍රියාවලිය සිහිනුවණින් සිදුකිරීම. එනම් හුස්ම ගන්නා විට හා පිට කරන විට අවබෝධයෙන් යුතුව එය අරමුණු කොට භාවනා කිරීම මින් අදහස් වන බව. මෙහිදී උද්ග්‍රහන නිමිති හා ප්‍රතිභාග නිමිති පහල වන බව. ආනාපානසති භාවනාව සමථයේ පටන් විපස්සනාව දක්වා දියුණු කළ හැකි බව.

*(ලකුණු 12)*